මේ කල්ප සියය ඇතුළත ලොව පහළ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේලා හත් නම උදෙසා කරනු ලබන වන්දනාව.

**ශ්‍රද්ධාවන්ත පින්වතුනි,**

සියලුම බුදුරජාණන් වහන්සේලාගේ අවබෝධය සමානයි. සියලුම බුදුරජාණන් වහන්සේලා දම්සක්පැවතුම් සූත්‍ර දේශනාවෙන් තමයි, ධර්ම ප්‍රචාරය ආරම්භ කරන්නේ. මේ කල්ප සියය ඇතුළත වැඩසිටිය, මේ සත් බුදුරජාණන් වහන්සේලාව වන්දනා කිරීම බුදුරජාණන් වහන්සේ වැඩසිටි කාලයේ පටන්ම, රහතන් වහන්සේලා විසින් ආරම්භ කර පවත්වාගෙන ආපු දෙයක්.

ඉතින් පින්වතුනි, අපි කවුරුත් පුද පූජා පවත්වන මේ බුදුරජාණන් වහන්සේලා, අනෙක් සියුලුම පුද්ගලයන්ගෙන් අසමානයි. ඒ නිසා උන්වහන්සේලාට කියනවා "අසම" කියලා. ඒ වගේම උන්වහන්සේලා බුදුරජාණන් වහන්සේලා සමඟ පමණක්ම සමාන වන නිසා "සම" කියලා කියනවා. ඒ නිසා ඒ බුදුරජාණන් වහන්සේලාට "අසමසම" කියලා කියනවා.

පින්වතුනි, ඝන අන්ධකාරය පමණක්ම තියෙන ලෝකාන්තරික කියල නිරයක් තියෙනවා. මේ නිරයේ සතුන් උපදින්නේ ඕපපාතිකව. මේ නිරයේ සතුන් ඝන අන්ධකාරයේම උපදිනවා මිසක, තවත් අය එහි සිටින බවක් දන්නේ නැහැ. බෝසතාණන් වහන්සේ නමක් තුසිත දෙව්ලොවින් නික්මෙලා මව්කුසක පිළිසිඳගන්න කොට ඒ ලෝකාන්තරික නරකයට පවා අලෝකයක් විහිදෙනවා. එතකොට තමයි තවත් අය ඒ නිරයේ ඉපදිලා ඉන්න බව දැනගන්නේ. බෝසතාණන් වහන්සේ නමක් මව්කුසක පිළිසිඳ ගන්න කොට වගේම, බෝසතාණන් වහන්සේ නමක් උපදින කොටත්, දස දහසක් ලෝක ධාතුවටම ආලෝකය විහිදෙනවා. ධම්මචක්කපවත්තන දේශනය කරන වේලාවෙත් දස දහසක් ලෝකධාතුවටම, දෙවියන්ගේ දේවානුභාවය ඉක්මවා යන ආලෝකයක් විහිදුණා.

ඉතින් බුදුරජාණන් වහන්සේලා මේ ලෝකයට පහළ වෙන්නේ චතුරාර්ය සත්‍යය ධර්මය කියා දෙන්නයි. බලන්න කොයිතරම් දුර්ලභ සිදුවීමක්ද? ඉතින් මේ පින්වතුන් සතුටු වෙන්න, "අපි සරණ ගියේ කොයිතරම් ශ්‍රේෂ්ඨ උත්තමයන් වහන්සේලාවද" කියලා. අපි ඒක හොඳට තේරුම් ගන්න ඕන. මොකද ලංකාවේ වුනත් බොහොම සුළු පිරිසකටයි, අවබෝධයෙන් යුක්තව තිසරණයේ පිහිටන්න අවස්ථාව ලැබිලා තියෙන්නේ. වැඩි පිරිසකට ඒ අවස්ථාව නැහැ. ඉතින් මේ පින්වතුන් "මේ මනුෂ්‍ය ලෝකෙ ඉපදිලා, තමන්ට ලැබුණු ඇස් වලින් ඵල ලබන මොහොතයි මේ, කණ් වලින් ඵල ලබන මොහොතයි මේ" කියලා සන්තෝසයට පත්වෙන්න ඕන. අපිට දුර්ලභ මනුෂ්‍ය ජීවිතය ලැබුණා. ඊටත් වඩා දුර්ලභ බුද්ධ ශාසනය ලැබුණා. ඉතින් "මේ සත්බුදුරජාණන් වහන්සේලාට පුද පූජා පවත්වලා, වන්දනා කරලා අපේ ජීවිත වලට බොහෝ කාලයක් හිත හිතා සතුටු වෙන්න පුළුවන් මහා පුණ්‍යකර්මයක් සිදු කරගත්තා" කියලා සතුටුවෙන්න.

නමස්කාර වේවා බුදු රුවනට සැමදා බුදු හිමි සරණ යමි
නමස්කාර වේවා දම් රුවනට සැමදා සදහම් සරණ යමි
නමස්කාර වේවා සඟ රුවනට සැමදා මහ සඟ සරණ යමි
නමස්කාර වේවා තුනුරුවනට සැමදා තිසරණ සරණ යමි

මාගේ ස්වාමී වූ, බුදුරජාණන් වහන්සේලා සියලු කෙලෙසුන් කෙරෙන් දුරු වූ සේක. රහසින්වත් පව් නොකළ සේක. සියලු පාපයන්ගෙන් මිදුන සේක. සියලු ලෝ වැසියන්ගේ ආමිස පූජා ප්‍රතිපත්ති පූජා පිළිගැනීමට සුදුසුවන සේක.

බුදුරජාණන් වහන්සේලා, ඇසින් රූප දැක ඒ රූප කෙරෙහි, නොඇලුන සේක. නොගැටුන සේක. මුලා නොවුණ සේක. ආශාව දුරුකළ සේක.

කණින් ශබ්ද අසා, ඒ ශබ්ද කෙරෙහි, නොඇලුන සේක. නොගැටුන සේක. මුලා නොවුන සේක. ආශාව දුරුකළ සේක.

නාසයෙන් ගඳ සුවඳ දැන, ඒ ගඳ සුවඳ කෙරෙහි, නොඇලුන සේක. නොගැටුන සේක. මුලා

නොවුන සේක. ආශාව දුරුකළ සේක.

දිවෙන් රස විඳ ඒ රසය කෙරෙහි, නොඇලුන සේක. නොගැටුන සේක. මුලා නොවුන සේක. ආශාව දුරුකළ සේක.

කයින් පහස ලබා ඒ පහස කෙරෙහි, නොඇලුන සේක. නොගැටුන සේක. මුලා නොවුන සේක. ආශාව දුරුකළ සේක.

මනසින් අරමුණු සිතා ඒ අරමුණු කෙරෙහි, නොඇලුන සේක. නොගැටුන සේක. මුලා නොවුන සේක. ආශාව දුරුකළ සේක.

බුදුරජාණන් වහන්සේලා 'අරහං' වන සේක. 'අරහං' වන සේක. 'අරහං' වන සේක.

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේලා ගුරුපදේශ නැතිවම තමන් වහන්සේලාගේ නුවණින්ම චතුරාර්ය සත්‍යය ධර්මය සත්‍ය ඥාණ වශයෙන්ද, කෘත්‍ය ඥාණ වශයෙන්ද, කෘත ඥාණ වශයෙන්ද, පරිවර්ත තුනකින් යුතුව, ආකාර දොළොසකින් යුතුව අවබෝධ කොට වදාළ නිසා 'සම්මා සම්බුද්ධ' වන සේක. 'සම්මා සම්බුද්ධ' වන සේක. 'සම්මා සම්බුද්ධ' වන සේක.

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේලා ඉර්ධි ප්‍රාතිහාර්ය ඥාණය ලබාගත් සේක. මනෝමය ඉර්ධි ඥාණය ලබාගත් සේක. පරචිත්ත විජානන ඥාණය ලබාගත් සේක. ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥාණය ලබාගත් සේක. දිව්‍ය ශ්‍රවණය ලබාගත් සේක. දිවැස් නුවණද ලබාගත් සේක. සියලු සත්වයන් ගැන ආසයානුසය ඥාණය ලබාගත් සේක. පුබ්බේනිවාසානුස්සති ඥාණය ලබාගත් සේක. චුතූපපාත ඥාණය ලබාගත් සේක. ආසවක්ඛය ඥාණය ලබාගත් සේක. මෙසේ අනන්ත වූ ඥාණ බලයෙන් යුතු වූ, අනන්ත වූ විද්‍යාවෙන් යුතු වූ, එයට අනුවම පවත්වන උතුම් හැසිරීමෙන් යුක්ත වූ, බුදුරජාණන් වහන්සේලා 'විජ්ජාචරණ සම්පන්න' වන සේක. 'විජ්ජාචරණ සම්පන්න' වන සේක. 'විජ්ජාචරණ සම්පන්න' වන සේක.

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේලා සුන්දර නිවන් මග අවබෝධ කරගෙන, සුන්දර නිවනට පැමිණ වදාළ නිසා 'සුගත' වන සේක. 'සුගත' වන සේක. 'සුගත' වන සේක.

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේලා, මේ සියලු ලෝක ධාතුද, අනන්ත සක්වළද, සියලු සත්වයන්ගේ ජීවිත පැවැත්මද, අවබෝධ කරගෙන ඒ සියලු ලෝක වලින් නිදහස් වී වදාළ නිසා 'ලෝකවිදූ' වන සේක. 'ලෝකවිදූ' වන සේක. 'ලෝකවිදූ' වන සේක.

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේලා ඉර්ධි ප්‍රාතිහාර්යයෙන්ද, අනුශාසනා ප්‍රාතිහාර්යයෙන්ද, ආදේශනා ප්‍රාතිහාර්යයෙන්ද, මහා කරුණාවෙන් අකීකරු දෙව් මිනිසුන් දමනය කොට, දහමට කීකරු කරවා අමා මහ නිවනට පමුණුවා වදාළ නිසා 'අනුත්තරෝ පුරිසදම්ම සාරථී' වන සේක. 'අනුත්තරෝ පුරිසදම්ම සාරථී' වන සේක. 'අනුත්තරෝ පුරිසදම්මසාරථී' වන සේක.

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේලා බුද්ධිමත් දෙවියන්ටද, බුද්ධිමත් මිනිසුන්ටද, සසර කතරෙන් එතෙරවීම පිණිස අනුශාසනා කොට වදාළ නිසා 'සත්ථා දේවමනුස්සානං' වන සේක. 'සත්ථා දේවමනුස්සානං' වන සේක. 'සත්ථා දේවමනුස්සානං' වන සේක.

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේලා අවබෝධ කොට වදාළ චතුරාර්ය සත්‍යය ධර්මය නම් වූ, මිහිරි ශ්‍රී සද්ධර්මය සියලු සතුන් වෙත මහා කරුණාවෙන්, ඉතා පැහැදිලි ලෙස, ඉතා සුන්දර ලෙස, පැහැදිලි වචන වලින්, පැහැදිලි අර්ථ වලින්, දේශනා කොට වදාළ නිසා 'බුද්ධ' වන සේක. 'බුද්ධ' වන සේක. 'බුද්ධ' වන සේක.

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේලා මේ සියලු සම්බුදු ගුණ දරා වැඩසිටින සේක. හිරු සඳු එළිය පරදින අනන්ත ප්‍රඥාලෝකයෙන් බබලන සේක. මහා කරුණාවෙන් සිසිල් වී ගිය හදමඬල ඇති සේක. බුදු රජාණන් වහන්සේලා 'භගවා' වන සේක. 'භගවා' වන සේක. 'භගවා' වන සේක.

මෙසේ අනන්තවූ, අප්‍රමාණ ගුණ ඇත්තා වූ අනන්ත ගුණ ඇති, අනන්ත නුවණ ඇති, අනන්ත සිල් ඇති, අනන්ත සිහිනුවණ ඇති, අනන්ත වීරිය ඇති, අනන්ත සමාධි ඇති, අනන්ත ප්‍රඥා ඇති, අනන්ත වූ විමුක්ති ඇති, අනන්ත වූ විමුක්ති ඤාණදර්ශන ඇති මහා කරුණාවෙන් සමන්විත වූ, මහා ප්‍රඥාවෙන් සමන්විත වූ විපස්සී නම් වූ බුදුරජාණන් වහන්සේගේ පටන් ගෞතම නම් වූ අපගේ බුදුරජාණන් වහන්සේ දක්වා මේ ලෝකය තුළ, මේ කල්ප සියය ඇතුළත, වැඩසිට වදාළ බුදුරජාණන් වහන්සේලාට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

මේ සත් බුදුරජාණන් වහන්සේ උදෙසා මේ බබලන පහන් ආලෝකය පූජා කරමි. පූජා වේවා!

මේ පැතිරෙන සුවඳ දුම් පූජා කරමි. පූජා වේවා!

මේ පිවිතුරු සුවඳ මල් පූජා කරමි. පූජා වේවා!

මේ සිසිල් පැන් පූජා කරමි. පූජා වේවා!

මේ මිහිරි ගිලන්පස පූජා කරමි. පූජා වේවා!

මේ සියලු අෂ්ටපාන වර්ග පූජා කරමි. පූජා වේවා!

ඉතා යහපත් ලෙස පිළියෙල කරන ලද, චතුමධුර සහිත වූ සියලු පූජාවන් පූජා කරමි. පූජා වේවා!

මේ අෂ්ට පරිෂ්කාරද පූජා කරමි. පූජා වේවා !

මේ සියලුම පූජාවෝ විපස්සී නම් වූ බුදුරජාණන් වහන්සේගේ පටන් ගෞතම නම් වූ අපගේ බුදුසමිඳුන් දක්වා සත් බුදුරජාණන් වහන්සේලා උදෙසා සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා! පූජා කරමි. පූජා වේවා! පූජා කරමි. පූජා ම වේවා !

සාදු! සාදු! සාදු!

## 1. විපස්සී බුදුරජාණන් වහන්සේ

මෙයින් අනූ එක් වෙනි කල්පයයි. එකල මිනිසුන් ගේ ආයුෂ වර්ෂ 80,000යි. විපස්සී බුදුරජුන් ක්ෂත්‍රිය වංශිකයි. පළොල් රුක් සෙවණකදී සම්බුද්ධත්වයට පත් වුණා. ඛණ්ඩ, තිස්ස යනු අගසව් යුවලයි. අසෝක යනු අග්‍ර උපස්ථායක භික්ෂුවයි. පියා බන්ධුම රජු. මව බන්ධුමා දේවියයි. බන්ධුමතී රාජධානිය.

1. ලොවේ ඇති හැම අඳුර නසනා
මහා නුවණැති මුනිරජාණනි
සදා සැනසිලි සුවය සදනා
ලොවේ අසදිස දම් රජාණෙනි

විපස්සී යන නමින් තිලොවේ
වැඳුම් ලබනා බුදුරජාණෙනි
දෑත නළලේ තබා වඳිනා
වැඳුම් පිළිගත මැන ස්වාමිනි

2. නසා සියලුම කෙලෙස් සතුරන්
ජය ලැබූ ලොව දම් රජාණෙනි
පළොල් රුක් සෙවනේදී බුදුරැස්
විහිදුවාලූ සිහ රජාණෙනි

මල් පහන් හා සුවඳ දුම් හා
සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම

පතාගෙන ඒ අම නිවන් සුව

## 2. සිඛී බුදුරජාණන් වහන්සේ

මෙයින් තිස් එක් වෙනි කල්පයයි. එකල මිනිසුන් ගේ ආයුෂ වර්ෂ 70,000යි. ක්ෂත්‍රිය වංශිකයි. හෙළඹ රැක් සෙවණකදී සම්බුද්ධත්වයට පත්වුණා. අභිභූ, සම්භව යනු අගසව් යුවලයි. ඛේමන්කර අග්‍ර උපස්ථායක භික්ෂුව යි. පියා අරුණ රජු. මව ප්‍රභාවතී දේවියයි. අරුණ රාජධානිය.

1. හෙළඹ රැක් සෙවණෙදී බුදුරැස්
විහිදුවාලූ මුනි රජාණෙනි
බිම්බරක් දස මාර සේනා
පරදවාලූ වීරයාණෙනි

සිඛී යන නාමයෙන් තුන් ලොව
පිදුම් ලබනා බුදුරජාණෙනි
දෑත නළලේ තබා වඳිනා
වැඳුම් පිළිගත මැන ස්වාමිනි

2. ලොවේ ඇති දුක් තැවුල් නිවනා
කාරුණික සම්බුදු රජාණෙනි
නුවණ වසනා අඳුර නසනා
මහා නුවණැති ගුණවතාණෙනි

මල් පහන් හා සුවඳ දුම් හා
සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම
පතාගෙන ඒ අම නිවන් සුව

## 3. වෙස්සභූ බුදුරජාණන් වහන්සේ

මෙයින් තිස් එක් වෙනි කල්පය. එකල මිනිසුන් ගේ ආයුෂ වර්ෂ 60,000යි. ක්ෂත්‍රිය වංශිකයි. සල් රැක් සෙවණකදී සම්බුද්ධත්වයට පත් වුණා. සෝණ, උත්තර යනු අගසව් යුවලයි. උපසාන්ත අග්‍ර උපස්ථායක භික්ෂුවයි. පියා සුප්පතීත රජු. මව යසවතී දේවියයි. අනෝම රාජධානිය.

1. වෙස්සභූ යන නමින් තුන් ලොව
එළිය කරනා මුනි රජාණෙනි
සාල රැක් සෙවණෙදී බුදුරැස්
විහිදුවාලූ සිහ රජාණෙනි

සියලු ලෝ සත වෙත දයාවෙන්
නිවන් සැප දුන් බුදු පියාණෙනි
දෑත නළලේ තබා වඳිනා
වැඳුම් පිළිගත මැන ස්වාමිනි

2. සිල් සමාහිත නුවණ පැතිරූ
වෙස්සභූ සම්බුදු රජාණෙනි
මිහිරි සදහම් සුවය සැලසූ
ලොවේ අසදිස දම් රජාණෙනි

මල් පහන් හා සුවඳ දුම් හා
සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම
පතාගෙන ඒ අම නිවන් සුව

## 4. කකුසඳ බුදුරජාණන් වහන්සේ

මේ මහා භද්‍ර කල්පය. එකල මිනිසුන්ගේ ආයුෂ වර්ෂ 40,000යි. බ්‍රාහ්මණ වංශිකයි. මහරි රුක් සෙවණකදී සම්බුද්ධත්වයට පත් වුණා. විධුර, සංජීව යනු අගසව් යුවල යි. 'බුද්ධිජ' අග්‍ර උපස්ථායක භික්ෂුවයි. පියා අග්ගිදත්ත බ්‍රාහ්මණ. මව විශාකා බැමිණියයි. ක්ෂේමවතී රාජධානිය.

1. උදා හිරු ලොව දිලෙන විලසින්
ලොවට වඩිනා බුදුරජාණෙනි
මහරි රුක් සෙවණෙ දී බුදුරැස්
විහිදුවාලූ දම් රජාණෙනි

නමින් කකුසඳ ලෙසින් තුන් ලොව
වැඳුම් ලබනා මුනි රජාණෙනි
දෑත නළලේ තබා වදිනා
වැඳුම් පිළිගත මැන ස්වාමිනි

2. හඬා වැළපෙන ලොවට සැනසුම
බෙදා දෙන සම්බුදු රජාණෙනි
අමා සැප ඇති නිවන් සැප දෙන
කාරුණික වූ දම් රජාණෙනි

මල් පහන් හා සුවඳ දුම් හා
සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම
පතාගෙන ඒ අම නිවන් සුව

## 5. කෝණාගමන බුදුරජාණන් වහන්සේ

මේ මහා භද්‍ර කල්පය. එකල මිනිසුන්ගේ ආයුෂ වර්ෂ 30,000යි. බ්‍රාහ්මණ වංශිකයි. දිඹුල් රුක් සෙවණකදී සම්බුද්ධත්වයට පත්වුණා. භීයෝස, උත්තර යනු අගසව් යුවලයි. සොත්ථිජ අග්‍ර උපස්ථායක භික්ෂුවයි. පියා යඥ්ඥදත්ත බ්‍රාහ්මණ. මව උත්තරා බැමිණියයි. සෝභවතී රාජධානිය.

1. දෙව්මිනිස් ලොව එළිය කරනා
මහා නුවණැති මුනි රජාණෙනි
දිඹුල් රුක් සෙවණෙදී බුදුරැස්
විහිදුවාලූ සිහ රජාණෙනි

නමින් කෝණාගමන ලෙස ලොව
වැඳුම් ලබනා ගුණවතාණෙනි
දෑත නළලේ තබා වදිනා
වැඳුම් පිළිගත මැන ස්වාමිනි

2. මහා කරුණා නෙතින් බලනා

කාරුණික සම්බුදු පියාණෙනි
වළාකුළු නැති අහසෙ දිලෙනා
සුපුන් සඳ වන් පින්වතාණෙනි

මල් පහන් හා සුවඳ දුම් හා
සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම
පතාගෙන ඒ අම නිවන් සුව

## 6. කාශ්‍යප බුදුරජාණන් වහන්සේ

මේ මහා භද්‍ර කල්පය. එකල මිනිසුන්ගේ ආයුෂ වර්ෂ 20,000යි. බ්‍රාහ්මණ වංශිකයි. නුග රුක් සෙවණකදී සම්බුද්ධත්වයට පත්වුණා. තිස්ස, භාරද්වාජ යනු අගසව් යුවලයි. සර්වමිත්‍ර අග්‍ර උපස්ථායක භික්ෂුවයි. පියා බ්‍රහ්මදත්ත බ්‍රාහ්මණ. මව ධනවතී බැමිණියයි. කිකී රාජධානිය.

1. සදකාලික සුවය සදනා
කාරුණික සම්බුදු රජාණෙනි
නුග රුකක් සෙවණෙ දී බුදුරැස්
විහිදුවාලූ සිහ රජාණෙනි

නිවා හැම දුක් තැවුල් තිලොවේ
අමා සැප දුන් මුනි රජාණෙනි
දෑත නළලේ තබා වඳිනා
වැඳුම් පිළිගත මැන ස්වාමිනි

2. ලොවට සැනසුම පතා ගෙන වැඩි
තථාගත සම්බුදු රජාණෙනි
හැමට යහපත උදාකරනා
කාරුණික වූ මුනි රජාණෙනි

මල් පහන් හා සුවඳ දුම් හා
සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම
පතාගෙන ඒ අම නිවන් සුව

## 7. ගෞතම බුදුරජාණන් වහන්සේ

මේ මහා භද්‍ර කල්පය. වසර 120යි. ක්ෂත්‍රීය වංශිකයි. ඇසතු රුක් සෙවණකදී සම්බුද්ධත්වයට පත් වුණා. සැරියුත්, මුගලන් යනු අගසව් යුවලයි. ආනන්ද අග්‍ර උපස්ථායක භික්ෂුවයි. පියා සුද්ධෝදන රජු. මව මහාමායා දේවියයි. කපිලවස්තු රාජධානිය.

1. පුරා දස පාරමී ගුණදම්
ලොවට වැඩි මහ ගුණවතාණෙනි
ඇසතු රුක් සෙවණෙදී බුදුරැස්
විහිදුවාලූ බුදුරජාණෙනි

නමින් ගෞතම ලෙසින් තුන් ලොව
වැඳුම් ලබනා මුනිරජාණෙනි
දෑත නළලේ තබා වඳිනා
වැඳුම් පිළිගත මැන ස්වාමිනි

2. අඳුරු වූ ලොව එළිය කරනා
මහා නුවණැති බුදුරජාණෙනි
අපට සැනසිලි සුවය සදනා
පිහිට ඔබමයි මුනිරජාණෙනි

මල් පහන් හා සුවඳ දුම් හා
සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම
පතාගෙන ඒ අම නිවන් සුව

**සාදු! සාදු!! සාදු!!!**

Mahamevnawa Buddhist Monastery,
Bierbrauer weg 8,
63071 Offenbach am main,
Germany.
Tel:- 0049 69 94 94 46 14
E mail :- info@mahamevnawa-germany.de
mahamevnawa.monastery.de@gmail.com
Web site :- www.mahamevnawa-germany.de